PROTECT THE EDUCATION STATE VICTORIA State Government Education and Training

# අපයෝජනයෙන් ළමුන් ආරක්‍ෂා කර ගැනීම : දෙමාපියන් සහ සුරැකුම්කරුවන් සඳහා

## කරුණු දැනගන්න

වැඩිහිටියන් හැටියට, ළමුන්ව හානි වලින් ආරක්‍ෂා කරගැනීම පිළිබඳව තීරණාත්මක කාර්යභාරයක් අපි ඉටු කරන්නෙමු.

දෙමාපියෙක් හෝ සුරැකුම්කරුවෙක් හැටියට, ඔබේ ළමයින්ට ආරක්‍ෂාව සහ සුරැකුම් සැපයීම, සහ  ඔවුනට සුරක්‍ෂිත සහ ගෞරවාන්විත සම්බන්ධතා ගොඩනගා ගැනීමට උපකාරී වීම පිළිබඳ මූලික වගකීම ඔබ සතුවේ.

ප්‍රජාව තුල සැක කටයුතු අපයෝජන හඳුනා ගැනීම සහ ඊට ප්‍රතිචාර දැක්වීම පිළිබඳවද ඔබට ඉතා වැදගත් කාර්යභාරයක් තිබේ. ඇත්තෙන්ම සැකසහිත ළමා ලිංගික අපයෝජන ගැන ඔබ වාර්තා නොකර සිටීම සාපරාධී වරදක් ලෙස සළකනු ඇත.

## අපයෝජන වාර්තා කිරීම

### *මගේ ළමයා* අපයෝජනයට ලක්ව ඇතැයි මම සැක කරන්නේ නම් මා කළ යුත්තේ කුමක්ද?

ඔබේ ළමයා අපයෝජනයට ලක්ව ඇතැයි හෝ අපයෝජනයට ලක් වීමේ අවදානමක් ඇතැයි ඔබ විශ්වාස කරන්නේ නම්, වහාම ප්‍රදේශයේ පොලිස් ස්ථානය හරහා වික්ටෝරියානු පොලිසිය වෙත හෝ එය හදිසි අනතුරක් නම් 000 අමතා දන්වන්න.

### *වෙනත් ළමයෙක්* අපයෝජනයට ලක්ව ඇතැයි මම සැක කරන්නේ නම් මා කළ යුත්තේ කුමක්ද?

යම් ළමයෙක් අපයෝජනයට ලක්ව ඇතැයි හෝ අපයෝජනයට (කායික අපයෝජනය, ගෘහස්ථ ප්‍රචණ්ඩතාවය හෝ නොසලකා හැරීම) ලක් වීමේ අවදානමක් ඇතැයි ඔබ විශ්වාස කරන්නේ නම්, ඔබ විසින් වහාම සෞඛ්‍ය සහ මානව සේවා දෙපාර්තමේන්තුවේ ළමා ආරක්‍ෂණයට {Department of Health and Human Services (DHHS) Child Protection} වාර්තා කළ යුතුය. (මෙම කරුණු පත්‍රයේ අග දැක්වෙන ඇමතුම් විස්තර බලන්න).

- ඔබේ ළමයා ලිංගික අපයෝජනයට පත්ව ඇතැයි ඔබ සැක කරන්නේ නම් ඒ ගැන ඔබ වික්ටෝරියානු පොලිසියටද වාර්තා කල යුතුය. මෙසේ වාර්තා නොකලහොත් ඔබ සාපරාධී වරදක් සිදු කලා විමට පුළුවන.
- ඔබ මෙය නිසැකවම නොදන්නේ වුවද ඔබ ඒ ගැන වාර්තා කල යුතුය. ඔබේ ගැටලුව විමර්ශනය කර ඒ ගැන ඉදිරි පියවයර ගත යුතුද යන්න තීරණය කිරීම බලධාරීන්ගේ කාර්යභාරයයි.
- බොහෝවිට දෙමාපියන් සහ සුරැකුම්කරුවන්ට තම ළමයින්ගේ මිතුරන්වද ආරක්‍ෂා කිරීමේ හැකියාව තිබේ. මීට හේතුව ළමුන් තමන්ට වු අපචාර තම මිතුරන්ට බොහෝවිට පවසන අතර එම මිතුරන් ඒ බව පෙරලා තම දෙමාපියන් සහ සුරැකුම්කරුවන්ට පැවසීමට ඉඩ තිබෙන බැවිනි.
- ඔබේ ළමයා ඔබ සමග ඔවුන්ගේ මිතුරන් ගැන කතා කරන විට, එම ළමයා අපචාරයට ලක්ව ඇති බව හෝ අපචාරයට ලක් වීමේ අවදානමට මුහුණ පා ඇති බව ඔබට සැක සිතුනහොත්, ඔබ ඒ ගැන ක්‍රියා කළ යුතුය. ඒ ගැන ක්‍රියා කිරීමට හැකි තත්ත්වයක සිටින එකම තැනැත්තා ඔබ වීමට ඉඩ ඇති අතර ඔබේ ප්‍රතිචාරය එම ළමයා ආරක්‍ෂා කිරීම සඳහා තීරණාත්මක විය හැකිය.

### *ළමයෙක්* අපයෝජනයට ලක්ව ඇතැයි මම සැක කරන අතර බලධාරීන් විසින් මා මීට පෙර ඒ ගැන කරන ලද වාර්තාව විමර්ශනය කර නිෂ්ප්‍රභා කරන ලද්දේ නම් මා කළ යුත්තේ කුමක්ද?

ළමයා අපයෝජනයට ලක්ව ඇති බවට අලුත් හේතු ඔබ සතුව තිබේ නම්, ඔබ වෙනත් වාර්තාවක් DHHS Child Protection හෝ වික්ටෝරියානු පොලිසියට ඉදිරිපත් කළ යුතුය. වාර්තා මගින් සාක්ෂි ගොඩනැගෙන නිසාත්, ළමුන්ට ඇති අවදානම් ගැන පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට බලධාරීන්ට උපකාරී වන නිසාත් සෑම වාර්තාවක්ම ළමයකුගේ ආරක්‍ෂාව සඳහා තීරණාත්මක වේ.

### මගේ ළමයා අපයෝජනයට ලක්ව ඇතැයි පාසලේ කෙනෙක් සැක කලහොත් මගේ ළමයාට කුමක් සිදුවේද?

පාසල් කාර්ය මණ්ඩලයේ සෑම කෙනෙක් විසින්ම සැක සහිත අපයෝජන ගැන DHHS, ළමා ආරක්‍ෂණය සහ සමහර අවස්ථා වලදී වික්ටෝරියානු පොලිසියටත් වාර්තා කිරීමට නියමිතය.

DHHS, ළමා ආරක්‍ෂණය සහ/හෝ වික්ටෝරියානු පොලිසිය විසින් එසේ නොකරන ලෙස උපදෙස් දී නැත්නම්, ඔබේ ළමයාගේ පාසල හැකි ඉක්මණින් ඔබව අමතනු ඇත.

උචිත අවස්ථා වලදී, සුභ සිද්ධිය පිළිබඳ වෘත්තිකයන් ඇතුලු උපකාර ළමයාට ලබා දීමට පාසල විසින් ඔබ හා සමග එක්ව කටයුතු කරණු ඇත.

### සැක කටයුතු අපයෝජන වාර්තා නෙකිරීම සාපරාධි වරදක් වනුයේ කුමණ විටද?

යම් වැඩිහිටියෙක්, තවත් වැඩිහිටියෙක් විසින් වයස අවුරුදු 16 ට අඩු ළමයකුට ලිංගික වරදක් සිදුකර ඇතැයි විශ්වාස කර, එම තොරතුරු පොලිසියට වාර්තා නොකර සිටියහොත් ඔවුන්ට අපරාධ චෝදනා වලට මුහුණ දීමට සිදුවිය හැකිය.

# ළමා අපයෝජනය පිළිබඳ කරුණු

## ළමා අපයෝජනය යනු කුමක්ද?

ළමා අපයෝජනය:

- කායික අපයෝජනය, ලිංගික අපයෝජනය, හිතවත්කම් පෑම (grooming), භාවාත්මක හෝ මානසික පීඩා, නොසළකා හැරීම හෝ පවුල් ප්‍රචණ්ඩත්වය
- ශාරීරික ස්පර්ශය හෝ බලාත්කාරය සිදුවීම අත්‍යවශ්‍ය නැත (උදා. ළමයෙකුට ලිංගිකව විවෘත ලෙස කතා කිරීම ළමා ලිංගික අපචාරයට ඇතුළත් වේ)
- ළමයාගේ පවුලේ කෙනෙක් හෝ පාසලේ කෙනෙක් ඇතුළුව, ප්‍රජාවේ ඕනෑම සාමාජිකයෙක් විසින් සිදුකළ හැකිය.

ළමා අපයෝජනය හා සම්බන්ධ කම්පනය ළමයකුගේ ශුභ සාධනයට සහ වර්ධනයට තදබල ලෙස බලපායි. අප සියළුදෙනා විසින්ම සෑම ආකාරයකම සැක සහිත අපයෝජන ගැන වහාම ප්‍රතිචාර දැක්වීම තීරණාත්මක වන්නේ මේ නිසාය.

## ළමයෙකු අපයෝජනයට ලක්ව ඇතැයි පෙන්වන ලකුණු මොනවාද?

ළමා අපයෝජනය පිළිබඳ කායික සහ චර්යාත්මක දර්ශක පරාසයක් තිබේ.

ඉතාමත් වැදගත් වන්නේ ළමයකු අපචාරයට ලක්වී ඇතැයි හෝ අපයෝජනයට ලක් වීමේ අවදානමට මුහුණපා ඇතැයි ඔබට සාධාරන විශ්වාසයකට එළඹිය හැකි පහත පෙන්වන ළකුණු (හෝ වෙනයම් දෙයක්)  ඔබ දුටුවහොත් ඒ ගැන ඔබ ක්‍රියා කිරීමයි ፡

- ළමයාගේ හැසිරීමේ වෙනසක් (උදා. නිෂ්කර්ෂණය, පසුගාමී හැසිරීම, හෝ වයසට අනුචිත ලිංගික චර්යා)
- අපයෝජනය පිළිබඳ ශාරීරික දර්ශක (උදා. පැහැදිලි කළ නොහැකි තැළීම්, වේවැල් පහරවල්, මන්ද පෝෂණයේ ළකුණු)
- වැඩිහිටියෙක් සහ ළමයෙක් අතර නුසුදුසු සම්බන්ධතාවක් (උදා. නුසුදුසු ලිංගික ස්පර්ශය, පැහැදිලි කළ නොහැකි තෑගි හෝ දුරකථන/ඊමේල් සබඳතා)

# පාසලේ කාර්යභාරය

## සැක කටයුතු ළමා අපයෝජනය කෙරෙහි පාසල් ප්‍රතික්‍රියා දැක්විය යුත්තේ කෙසේද?

වික්ටෝරියානු පාසල් වල සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයෝ ඕනෑම අපයෝජන සිද්ධියක් හෝ සැකයක් ගැන පහත දැක්වෙන ලෙස ප්‍රතිචාර දැක්වීමට බැඳී සිටී ፡

**1. හදිසි අනතුරට ප්‍රතිචාර දක්වන්න**

වහා ඉටු කළ යුතු සෞඛ්‍ය සහ ආරක්ෂක අවශ්‍යතා සපුරා ලන්න (උදා. ප්‍රථමාධාර දීම හෝ හදිසි
අනතුරු සේවා ඇමතීම)

**2. බලධාරීන්ට දැනුම් දෙන්න**

ළමයකු අපචාරයට ලක්වී ඇතැයි හෝ අපයෝජනයට ලක් වීමේ අවදානමට මුහුණපා ඇතැයි ඔබට සාධාරන විශ්වාසයක් ඇතිවී නම් ඒ ගැන DHHS Child Protection හෝ වික්ටෝරියානු පොලිසියට වාර්තා කරන්න.

**3. දෙමාපියන්/සුරැකුම්කරුවන් උචිත පරිදි අමතන්න**

දෙමාපියන්/සුරැකුම්කරුවන් ඇමතීම ආරක්ෂිත සහ සුදුසු බවට බලධාරීන් උපදෙස් දුන් විට ඔවුන්ව අමතන්න.

කල්පිත වශයෙන් දෙමාපිය/සුරැකුම්කරුවන් තම ළමයින්ට උපකාර සැපයීමේ කේන්ද්‍රීය භූමිකාව ඉටු කළද, දෙමාපිය/සුරැකුම්කරුවන් ඇමතීම විමර්ශන කටයුතු වලට බාධාවක් විය හැකි හෝ ළමයා වැඩි අනතුරකට පත් කළ හැකි අවස්ථා වලදී පාසල් වලට උපදෙස් දී ඇත්තේ දෙමාපිය/සුරැකුම්කරුවන් ඇමතීමෙන් වළකින ලෙසය.

**4. අපයෝජන බලපෑමට ලක්ව ඇති ළමුන්ට දිගටම උපකාර සපයන්න**

අපයෝජන බලපෑමට ලක්ව ඇති සියලුම ළමුන්ට උපකාර සපයන්න. වෘත්තිකයන් විසින් දිගටම උපදේශන ලබාදීම මීට ඇතුළත් විය හැකිය.ළමයාට දිගටම ලබා දෙන උපකාර ශිෂ්‍ය උපකාර සැළසුමෙහි *(Student Support Plan)*. ලේඛනගත කරනු ලැබේ.

මෙම ක්‍රියා මාර්ග වික්ටෝරියානු පාසල් වල සෑම ආකාරයකම අපයෝජන හඳුනාගැනීම සහ ප්‍රතිචාර කිරීමෙහි *(Identifying and Responding to All Forms of Abuse in Victorian Schools)* විස්තරාත්මකව සඳහන් කර ඇත.

## මගේ ළමයාගේ පාසලේ කාර්ය මණ්ඩලය විසින් ළමා අපයෝජන ගැන වාර්තා කිරීම අවශ්‍යතාවයක්ද?

ඔව් - ඔබේ ළමයාගේ පාසලේ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාම විසින් ළමයෙක් අපයෝජනයට ලක්ව ඇතැයි සාධාරනව විශ්වාස කරන සෑම විටකම සහ ළමයෙක් අපයෝජනයට ලක්වීමේ අවදානමට ලක්ව ඇති සෑම විටම ඒ ගැන වාර්තා කිරීම නෛතික අවශ්‍යතාවයකි.

සමහර අවස්ථා වලදී, පාසලේ කාර්ය මණ්ඩලය විසින් ළමා අපයෝජනය බලධාරීන්ට වාර්තා නොකිරීම සාපරාධී වරදක් විය හැකිය.

# මගේ ළමයාව ආරක්ෂා කර ගැනීම

## මගේ ළමයාව අපයෝජනයෙන් ආරක්ෂා කර ගැනීමට සහ දැනුවත් කිරීමට මට කළ හැක්කේ මොනවාද?

ළමයා සමග කතා කර, ඔහුව හෝ ඇයව අපහසුතාවයකට පත් කරන අන්දමට තර්ජනය කිරීමට, පීඩා කිරීමට හෝ ස්පර්ශ කිරීමට කිසිම පුද්ගලයෙකුට ඉඩක් නැති බවට දැනුවත් කරන්න.

සෑම සබඳතාවයක්ම ගෞරවාන්විත විය යුතු අතර ඔවුන් ආරක්ෂා රහිත බව හඟවන හෝ බිය වද්දන ආකාරයට කිසිම කෙනෙක් හැසිරිය යුතු නැත.

තමන්ගේ ආරක්ෂාව සහ ගෞරවාන්විත බව පිළිබඳව ඔවුන්ට ඇති අයිතිය ගැන ඉගෙනීමට ඔබේ ළමයාට ඔබේ ළමයාගේ පාසල විසින් උපකාර කරනු ලැබේ. ධනාත්මක ආකල්ප සහ හැසිරීම් ප්‍රවර්ධනය කරන, පවුල් ප්‍රචණ්ඩතාව වැළැක්වීම ඉලක්ක කරගත් *ගෞරවාන්විත සම්බන්ධතා (Respectful Relationships)* වැඩසටහන වික්ටෝරියානු පාසල් විසින් උගන්වනු ලැබේ.

## මගේ ළමයාට ආරක්ෂාව පිළිබඳව තේරුම් කරදෙන විට මම පැවසිය යුත්තේ මොනවාද?

ආරක්ෂිත සහ ගෞරවාන්විත සබඳතා පිළිබඳව ඔබේ ළමයාගේ වැටහීම වර්ධනය කරණු පිණිස ඔබට නිවසේදී කළහැකි සමහර දේවල් ඃ

- ඔවුන්ගේ හැඟීම් සහ සම්බන්ධතා ගැන ඔබේ ළමයින් සමග විවෘතව කතා කිරීම
- යම් කිසි කෙනෙක් ඔවුන්ට සළකන ආකාරය ගැන ඔවුන් තුල ගැටලුවක් ඇත් නම් ඔබ ඒ ගැන ඇහුම්කන් දෙන බව සහ ක්‍රියා කරන බවට ඔවුන් තේරුම් ගන්නා බවට සහතික වීම
- ශරීරයේ අංග ගැන නිවැරදි නම භාවිතා කිරීම සහ ස්පර්ශය සහ ලිංගික ක්‍රියා ගැන වයසට අනුකුල සංවාදයක යෙදීම
- වැඩිහිටියන් කිසිම විටක කිසිම ළමයෙකුට හානි නොකල යුතු බව සහ ලිංගික අන්දමට ක්‍රියා නොකල යුතු බව ඔබේ ළමයාට දන්වා සිටීම

## ගෙදරින් සහ පාසලෙන් පිටදී ළමුන් ආරක්ෂා කරගැනීම

ඔබේ ළමුන් සුරක්ෂිත තැන් වල කල් ගෙවන බව සහතික කරගැනීම පිළිබඳව ඔබ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

වික්ටෝරියාවේ ළමුන් සමග වැඩකරන (පුහුණුකරුවන්, සංගීත ගුරුවරු වැනි) සියලු දෙනාටම දැනට වලංගු ළමුන් සමග වැඩ කිරීමේ පිරික්සුමක් (Working With Children Check) තිබිය යුතුය.

පාසල හැරුන පසු වේලාවේ සහ සති අන්තයේ ඔබේ ළමුන් සමග කල් ගතකරන ස්වේච්ඡා පුද්ගලයන් සතුවද වලංගු ළමුන් සමග වැඩ කිරීමේ පිරික්සුමක් තිබේදැයි පිරික්සා බලන්න.

ඔබේ ළමුන් හානියෙන් ආරක්ෂා කර ඔවුන්ගේ නිරෝගී වර්ධනයට සහාය වීම සඳහා යම් උපකාර අවශ්‍යයයි ඔබ සිතන්නේ නම්, ඒ සඳහා ඔබ උදව් ලබා ගැනීම වැදගත්ය. උදව් ලබා ගැනීම ගැන වික්ටෝරියානු රජයේ Better Health Channel වෙත පිවිසෙන්න www.betterhealth.vic.gov.au බලන්න.





## වැඩිදුර තොරතුරු

### වැඩිදුර තොරතුරු සහ උපකාර මට ලබා ගත හැක්කේ කොතැනින්ද ?

ඔබේ ළමයාගේ ශුභ සිද්ධිය ගැන ඔබට ඇති ඕනෑම ගැටලුවක් ගැන සාකච්චා කිරීම සඳහා DHHS Child Protection හෝ වික්ටෝරියානු පොලිසිය ඔබට කෙලින්ම ඇමතීමට පුළුවන (ඇමතුම් විස්තර මීලඟ පිටුවේ)

ඔබේ ළමයා හෝ ඔබේ ළමයාගේ පාසලේ වෙනත් ළමයෙක් ගැන ඔබට ගැටලුවක් තිබේ නම් පාසලේ විදුහල්පති හෝ පාසලේ වෙනත් කාර්ය මණ්ඩල සාමාජිකයකු සමග ඒ ගැන කතා කරන්න. මේ කරුණු DHHS Child Protection හෝ වික්ටෝරියානු පොලිසිය සමගද කතා කිරීමට ඔබට හැකිය.

ඔබේ ළමුන් හානියෙන් ආරක්ෂිතව තබා ගැනීමට අවශ්‍ය උපකාර ඔබට ලබා ගත හැකි තැන් ගැන වැඩිදුර තොරතුරු සඳහා වික්ටෝරියානු රජයේ Better Health Channel වෙත පිවිසෙන්නඃ www.betterhealth.vic.gov.au

මේ ගැන වැඩි විස්තර සඳහා ඃ

- ළමා අපයෝජනය වැළැක්වීම සහ පාලනය කිරීම ගැන ඔබේ ළමයාගේ පාසලේ කාර්යභාරය : www.education.vic.gov.au/protect
- අපයෝජනය පිළිබඳ දර්ශක සඳහා පිවිසෙන්න www.education.vic.gov.au/protect

ඔබේ පාසලේ ප්‍රතිචාරය ගැන ගැටලුවක් හෝ සැකයක් ඇත්නම් සහ/හෝ පාසලෙන් පිටස්තර කෙනෙක් සමග කතා කිරීමට ඔබ කැමැත්තේ නම් කරුණාකර අමතන්න ඃ

- වික්ටෝරියානු රජයේ පාසල් ප්‍රාදේශීය කාර්යාලය Victorian government schools Regional Office: www.education.vic.gov.au/about/contact/Pages/regions.aspx
- කතෝලික පාසල් ප්‍රදේශීය දියෝකීස අධ්‍යාපන කාර්යාලය Catholic Schools local Diocesan education office: www.cecv.catholic.edu.au/About-Us/Dioceses
- වික්ටෝරියානු ස්වාධීන පාසල් Independent Schools Victoria: www.is.vic.edu.au/who-we-are/contact-us/

# ඇමතුම් තොරතුරු

## 24 පැයේ සේවා

| | |
|---|---|
| වික්ටෝරියානු පොලිසිය | **000** |
| සෞඛ්‍ය සහ මානව සේවා දෙපාර්තමේන්තුව ළමා ආරක්ෂණය (Department of Health and Human Services Child Protection) | **131 278** |
| අධ්‍යපන සහ පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව ආරක්ෂක සේවා ඒකකය (Department of Education and Training Security Services Unit) | **(03) 9589 6266** |

## අධ්‍යපන සහ පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව **(Department of Education and Training)**

| | |
|---|---|
| ආරක්ෂක සේවා ඒකකය | **(03) 9589 6266** |
| ශිෂ්‍ය සිද්ධි සහ ප්‍රතිසාධන ඒකකය (Student Incident and Recovery Unit) | **(03) 9637 2934** හෝ **(03) 9637 2487** |
| නීති අංශය | **(03) 9637 3146** |
| සේවක උපකාර වැඩසටහන (Employee Assistance Program) | **1300 361 008** |
| සේවක සෞඛ්‍යය | **(03) 9637 2395** |
| සේවක චර්යා අංශය | **(03) 9637 2595** |
| පෞද්ගලිකත්ව ඒකකය | **(03) 9637 3601** |
| අන්තර්ජාතික අංශය | **(03) 9651 3976** |
| සන්නිවේදන අංශය | **(03) 9637 2871** |

## කතෝලික අධ්‍යාපනය

| | |
|---|---|
| මෙල්බර්න් අගරදගුරුතුමාගේ බල ප්‍රදේශය<br>▪ වෘත්තීය කල්ක්‍රියාව, සාරධර්ම සහ විමර්ශන කාර්යාලය (Office of Professional Conduct, Ethics & Investigation)<br>▪ නෛතික සේවා<br>▪ ශිෂ්‍ය ශුභ සාධන තොරතුරු සේවය (Student Wellbeing Information Line)<br>▪ සන්නිවේදන සහ අලෙවිකරණ ඒකකය (Communications & Marketing Unit) (මාධ්‍ය උපදේශක) | **(03) 9267 0228** |
| Sale දියෝකීසිය | **(03) 5622 6600** |
| Ballarat දියෝකීසිය | **(03) 5337 7135** |
| Sandhurst දියෝකීසිය | **(03) 5443 2377** |

## ස්වාධීන පාසල්

| | |
|---|---|
| වික්ටෝරියා ස්වාධීන පාසල් (Independent Schools Victoria) | **(03) 9825 7200** |

## ප්‍රාදේශීය

| | |
|---|---|
| **ඊසාන දිග වික්ටෝරියාව** | |
| සාමාන්‍ය විමසීම් | **1300 333 231** |
| Benalla කාර්යාලය | **(03) 8392 9500** |
| Glen Waverley කාර්යාලය | **(03) 8392 9300** |
| **වයඹ දිග වික්ටෝරියාව** | |
| Bendigo කාර්යාලය | **(03) 5337 8444** |
| Coburg කාර්යාලය | **(03) 9488 9488** |
| **ගිනිකොන දිග වික්ටෝරියාව** | |
| Dandenong කාර්යාලය | **(03) 8765 5600** |
| Moe කාර්යාලය | **(03) 5127 0400** |
| **නිරිත දිග වික්ටෝරියාව** | |
| සාමාන්‍ය විමසීම් | **1300 333 232** |
| Ballarat කාර්යාලය | **(03) 5337 8444** |
| Footscray කාර්යාලය | **(03) 8397 0300** |
| Geelong කාර්යාලය | **(03) 5225 1000** |
| Horsham කාර්යාලය | **(03) 5310 5300** |
| Warrnambool කාර්යාලය | **1300 333 232** |

## සෞඛ්‍ය සහ මානව සේවා දෙපාර්තමේන්තුව ළමා රක්ෂණ (Department of Health and Human Services Child Protection)

| ප්‍රදේශය | පළාත් පාලන ප්‍රදේශ **Local Government Areas (LGAs)** | දුරකථන අංකය |
|---|---|---|
| උතුරු සහ බටහිර උපනගර පළාත් පාලන ප්‍රදේශ | Banyule, Brimbank, Darebin, Hobsons Bay, Hume, Maribyrnong, Melbourne, Melton, Moonee Valley, Moreland, Nillumbik, Whittlesea, Wyndham, Yarra. | **1300 664 977** |
| නැගෙනහිර උපනගර පළාත් පාලන ප්‍රදේශ | Boroondara, Knox, Manningham, Maroondah, Monash, Whitehorse, Yarra Ranges. | **1300 360 391** |
| දකුණු උපනගර පළාත් පාලන ප්‍රදේශ | Bayside, Cardinia, Casey, Frankston, Glen Eira, Greater Dandenong, Kingston, Mornington Peninsula, Port Phillip, Stonnington. | **1300 655 795** |
| බටහිර ග්‍රාමීය සහ ප්‍රාදේශීය පළාත් පාලන ප්‍රදේශ | Ararat, Ballarat, Golden Plains, Hepburn, Hindmarsh, Horsham, Moorabool, Northern Grampians, Pyrenees, West Wimmera, Yarriambiack, Colac-Otway, Corangamite, Glenelg, Greater Geelong, Moyne, Queenscliffe, Southern Grampians,<br>Surf Coast, Warrnambool. | **1800 075 599** |
| වයඹ දිග ග්‍රාමීය සහ ප්‍රාදේශීය පළාත් පාලන ප්‍රදේශ | Buloke, Campaspe, Central Goldfields, Gannawarra, Greater Bendigo, Loddon, Macedon Ranges, Mildura, Mount Alexander, Swan Hill. | **1800 675 598** |
| ඊසාන දිග ග්‍රාමීය සහ ප්‍රාදේශීය පළාත් පාලන ප්‍රදේශ | Alpine, Benalla, Greater Shepparton, Indigo, Mansfield, Mitchell, Moira, Murrindindi, Strathbogie, Towong, Wangaratta, Wodonga. | **1800 650 227** |
| නැගෙනහිර සහ අග්නි දිග ග්‍රාමීය සහ ප්‍රාදේශීය පළාත් පාලන ප්‍රදේශ | Bass Coast, Baw Baw, East Gippsland, Latrobe, South Gippsland, Wellington. | **1800 020 202** |

## Child First

| | |
|---|---|
| Alpine | **1800 705 211** |
| Ararat | **1300 783 341** |
| Ballarat | **1300 783 341** |
| Banyule | **(03) 9450 0955** |
| Bass Coast | **(03) 5662 5150** |
| Baw Baw | **1800 339 100** |
| Bayside | **1300 367 441** |
| Benalla | **1800 705 211** |
| Boroondara | **1300 762 125** |
| Brimbank | **1300 138 180** |
| Buloke | **1300 665 218** |
| Campaspe | **1800 260 338** |
| Cardinia | **(03) 9705 3939** |
| Cardinia - ආදිවාසී ළමුන් සහ පවුල් | **(03) 9794 5973** |
| Casey | **(03) 9705 3939** |
| Casey - ආදිවාසී ළමුන් සහ පවුල් | **(03) 9794 5973** |
| Central Goldfields | **1800 260 338** |
| Colac-Otway | **(03) 5232 5500** |
| Corangamite | **(03) 5232 5500** |
| Darebin | **(03) 9450 0955** |
| East Gippsland | **(03) 5152 0052** |
| Frankston | **1300 721 383** |
| Gannawarra | **1300 665 218** |
| Glen Eira | **1300 367 441** |
| Glenelg | **1300 543 779** |
| Golden Plains | **1300 783 341** |
| Greater Bendigo | **1800 260 338** |
| Greater Dandenong | **(03) 9705 3939** |
| Greater Dandenong – ආදිවාසී ළමුන් සහ පවුල් | **(03) 9794 5973** |
| Greater Geelong | **1300 551 948** |
| Greater Shepparton | **1300 854 944** |
| Hepburn | **1300 783 341** |
| Hindmarsh | **1800 195 114** |
| Hobson's Bay | **1300 775 160** |
| Horsham | **1800 195 114** |
| Hume | **1300 786 433** |
| Indigo | **1800 705 211** |
| Kingston | **1300 367 441** |
| Knox | **1300 369 146** |
| La Trobe | **1800 339 100** |
| Loddon | **1800 260 338** |
| Macedon Ranges | **1800 260 338** |
| Manningham | **1300 762 125** |

| | |
|---|---|
| Mansfield | **1800 705 211** |
| Maribyrnong | **1300 775 160** |
| Maroondah | **1300 369 146** |
| Melbourne | **1300 775 160** |
| Melton | **1300 138 180** |
| Mildura | **1300 625 533** |
| Mitchell | **1800 663 107** |
| Moira | **1300 854 944** |
| Monash | **1300 762 125** |
| Moonee Valley | **1300 775 160** |
| Macedon Ranges | **1300 783 341** |
| Moorabool | **1300 786 433** |
| Moreland | **1300 721 383** |
| Mornington Peninsula | **1800 260 338** |
| Mount Alexander | **1300 543 779** |
| Moyne | **1800 663 107** |
| Nillumbik | **(03) 9450 0955** |
| Northern Grampians | **1800 195 114** |
| Port Phillip | **1300 367 441** |
| Pyrenees | **1300 783 341** |
| Queenscliff | **1300 551 948** |
| South Gippsland | **(03) 5662 5150** |
| Southern Grampians | **1300 543 779** |
| Stonnington | **1300 367 441** |
| Strathbogie | **1300 854 944** |
| Surf Coast | **1300 551 948** |
| Swan Hill | **1300 665 218** |
| Towong | **1800 705 211** |
| Wangaratta | **1800 705 211** |
| Warrnambool | **1300 543 779** |
| Wellington | **(03) 5144 7777** |
| West Wimmera | **1800 195 114** |
| Whitehorse | **1300 762 125** |
| Whittlesea | **(03) 9450 0955** |
| Wodonga | **1800 705 211** |
| Wyndham | **1300 775 160** |
| Yarra | **(03) 9450 0955** |
| Yarra Ranges | **1300 369 146** |
| Yarriambiak | **1800 195 114** |

## වෙනත් සේවා

| | |
|---|---|
| ලිංගික අඩන්තේට්ටම් විරෝධී මධ්‍යස්ථාන - හදිසි උපදේශන සහ උපකාර රැහැන 1800 806 292 (Centres Against Sexual Assault (CASA) – Emergency Counselling & Support Line) | **1800 806 292** |
| Australian Childhood Foundation | **1800 176 453** |
| Children's Protection Society | **(03) 9450 0900** |
| Child Wise | **(03) 9695 8900** |
| Vic Aboriginal Education Association | **(03) 9481 0800** |
| Child Safety Commission | **1300 782 978** |
| Office of the Children's eSafety Commissioner | **1800 880 176** |
| Victorian Aboriginal Child Care Agency (VACCA) | **(03) 9287 8800** |
| Victorian Aboriginal Community Controlled Health Organinsation (VACCHO) | **(03) 9411 9411** |

## ලිංගික අපයෝජන හැසිරීම් ප්‍රතිකාර සේවා සපයන්නෝ :

| | |
|---|---|
| Aust Childhood Foundation | **(03) 9874 3922** |
| Children's Protection Society | **(03) 9450 0900** |
| Berry St | **(03) 5822 8100** |
| මැලී ලිංගික අඩන්තේට්ටම් (Mallee Sexual Assault) | **(03) 5025 5400** |
| South Eastern CASA | **(03) 9928 8741** |
| Ballarat CASA | **(03) 5320 3933** |
| Barwon CASA | **(03) 5222 4318** |
| Campaspe CASA | **(03) 5441 0430** |
| Gippsland CASA | **(03) 5134 3922** |
| Goulburn Valley CASA | **(03) 5831 2343** |
| Upper Murray CASA | **(03) 5722 2203** |
| Wimmera CASA | **(03) 5381 9270** |

